**කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2025**

---

කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ දිස්ත්‍රික්කයේ කොහුවල සහ මහනුවර දිස්ත්‍රික්කයේ ගැටඹේ යන ස්ථානවල ස්ථානගත කිරීමට සැලසුම් කර ඇති ගුවන් පාලම් නිර්මාණය කිරීම සහ ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. කොහුවල ගුවන් පාලම සහ ගැටඹේ ගුවන් පාලම යන නමින් වැඩ බිම් 02 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 18,932.65 කට සමාන යූරෝ මිලියන 55.98 ක් වන අතර ඉන් රු.මිලියන 3,026.98 කට සමාන යූරෝ මිලියන 55.98 ක් සැපයීමට හංගේරියානු ආනයන - අපනයන බැංකුව සමඟ එකඟ වී තිබුණි. ඉතිරි වටිනාකම වූ රු.මිලියන 15,905.67 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2021 අගෝස්තු 16 දින ආරම්භ කර ප්‍රථමයෙන් කොහුවල සඳහා 2023 ජූනි 16 වන දින සහ ගැටඹේ සඳහා 2023 දෙසැම්බර් 16 වන දින නිම කිරීමට සැලසුම් කර තිබූ අතර පසුව, අවබෝධතා ගිවිසුම (MOU) සඳහා වූ අතිරේක ගිවිසුමක් මගින් ව්‍යාපෘතිය අවසන් කිරීමේ කාලසීමාව 2025 ජූනි 30 දක්වා දීර්ඝ කරන ලදී. 2026 පෙබරවාරි 10 වන දින තවත් අතිරේක ගිවිසුමකට අත්සන් තබන ලදී. එම ගිවිසුමට අනුව, එක් එක් ව්‍යාපෘතිය සඳහා අවසන් කිරීමේ කාලසීමාව, නැවත ආරම්භ කළ දින සිට කොහුවල ව්‍යාපෘතිය සඳහා මාස 3 කින් සහ ගැටඹේ ව්‍යාපෘතිය සඳහා මාස 22 කින් දීර්ඝ කරන ලදී.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මගේ මතය අනුව, මගේ වාර්තාවේ 2.1 කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර 2025 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහයන් ගෙන් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | වටිනාකම (රු.මිලියන) | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 05 හි 43(අ) වගන්තියට අනුව, ඉදිරිපත් කරනු ලබන සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක් සඳහාම අදාළ වත්කම් සහ වගකීම්, එකී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අවසාන දිනට පැවති විදේශ විනිමය අනුපාතය යොදා ගනිමින් පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ගිණුම සහ කෙරීගෙන යන වැඩ ගිණුම පිළිවෙලින් රුපියල් මිලියන 55.18 කින් සහ රුපියල් මිලියන 862.61 කින් අඩුවෙන් සටහන් කර තිබුණි. | 917.79 | එකඟ වේ. නමුත් ගෙවිය යුතු ශේෂයන් අවසන් විනිමය අනුපාතය (closing rate) අනුව පරිවර්තනය නොකිරීම හේතුවෙන්, කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ගිණුමේ අගය රුපියල් මිලියන 55.18 කින් අඩුවෙන් සටහන් වී ඇත. කෙසේ වෙතත්, අඩුවෙන් සටහන් වී තිබූ එම වටිනාකම මෙම වසරේ අංක 26-01 දරන ජර්නල් සටහන මගින් නිවැරදි කර ඇත. ඉදිරියේදී විදේශ විනිමය ලාභ හෝ අලාභ ගිණුමේ සටහන් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූල විය යුතුය. |
| (ආ) | වැඩපූර්ව අත්තිකාරම් අයකර ගැනීමේ ඇපකර වටිනාකම වූ රුපියල් මිලියන 227.16 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 227.16 | එකඟ වේ. මෙතෙක් අය කර නොතිබූ අත්තිකාරම් මුදල, මේ දක්වා ගෙවීමට ඉතිරිව ඇති සහතික කළ ශුද්ධ වටිනාකම වන යුරෝ 8,056,150.31 ට එරෙහිව පියවා ඇත. එමනිසා, ඉහත සඳහන් පියවීම හේතුවෙන් මුල් ගිවිසුම යටතේ අය කරගත යුතුව තිබූ අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන්ම අය කර ගන්නා ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය. |

### 2.2 නීති රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම /විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 05 දිනැති හා අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් තුනක් පමණක් පවත්වා තිබුණි. | පළාත් පාලන මැතිවරණය සහ "දිට්වා" (Ditwah) සුළි කුණාටු තත්ත්වය හේතුවෙන්, 2025 විගණන වර්ෂය තුළ නියමිත මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් මෙහෙයුම් කමිටු රැස්වීම් අදාළ චක්‍රලේඛවලට අනුකූලව පවත්වනු ලබන බව තහවුරු |

| | | | | |
|---|---|---|---|---|
| | | | කෙසේ වෙතත්, අදාළ වර්ෂය තුළ රැස්වීම් තුනක් පැවැත්වීමට හැකි විය. | කළ යුතුය. |
| (ආ) | 2019 ජනවාරි 12 දිනැති හා අංක DMA/01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටුවක් පිහිටුවිය යුතුය. එම කමිටුව වසරකට අවම වශයෙන් රැස්වීම් හතරක්වත් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් රැස්වීම් තුනක් පවත්වන ලද අතර, ඉන් දෙකකට ලේකම්වරයා සහ එක් රැස්වීමකට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා මුලසුන හොබවන ලදී. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව, නිශ්චිතව දක්වා ඇති රැස්වීම් දෙක අනාගතයේදී නිතිපතා සංවිධානය කරන ලෙස ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත උපදෙස් දීමට සටහන් කර ගතිමි. | අභ්‍යන්තර විගණන කමිටු රැස්වීම් අදාළ චක්‍රලේඛවලට අනුකූලව පැවැත්වෙන බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් තහවුරු කළ යුතුය. |
| (ඇ) | 2024 ඔක්තෝබර් 24 දිනැති හා අංක DMA/2/2024 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 වන වගන්තිය | ක්‍රියාත්මක කරවන /ක්‍රියාත්මක කරන ආයතනය සඳහා පත් කර ඇති අභ්‍යන්තර විගණකවරයා විසින්, ජාතික විගණන පනතේ 40(1) වගන්තියට සහ මුදල් රෙගුලාසි අංක 133ට අනුකූලව ව්‍යාපෘති විගණනය සිදු කළ යුතුව ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | මෙම තනතුර සඳහා අයදුම්පත් කැඳවා තිබුණි. කෙසේ වෙතත්, ඊට සුදුසු අපේක්ෂකයින් කිසිවෙකු අයදුම් නොකළ බැවින් සම්මුඛ පරීක්ෂණය නැවත කැඳවන ලදී. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් ඵලදායී සහ ස්වාධීන අභ්‍යන්තර විගණන ක්‍රියාවලියක් පවතින බව තහවුරු කළ යුතුය. |

3. **භෞතික කාර්ය සාධනය**

3.1 **අරමුදල් උපයෝජනය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2025 අයවැය ඇස්තමේන්තුවට අනුව, කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් ව්‍යාපෘතිය සඳහා මූල්‍ය විෂය හා අංක 117-2-6-26-2104(12) (රු. මිලියන 8,000), | එකඟ වේ. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් වෙන් කරන ලද අරමුදල් භාවිතය සහ ව්‍යාපෘතියේ ඉතිරි |

| | | | |
|---|---|---|---|
| | 117-2-6-26-2104(17) (රු. මිලියන 2,800) සහ 117-2-6-26-2105(11) (රු. මිලියන 100) යටතේ රු. මිලියන 10,900 ක මුදලක් වෙන් කර තිබුණි. හංගේරියානු අපනයන-ආනයන (EXIM) බැංකුව විසින් විදේශීය ණය ලබා දීම නවත්වන බව 2025 පෙබරවාරි මාසයේදී නිවේදනය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුවේදී මූලික අයවැය වෙන්කිරීම රු. මිලියන 185 ක් දක්වා සියයට 98 කින් සංශෝධනය කර තිබූ බව නිරීක්ෂණය විය. එම සංශෝධිත වෙන් කිරීමෙන් රු. මිලියන 175.24 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ වැය කර තිබූ අතර, රු. මිලියන 9.76 ක ශේෂයක් භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවා තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතිය මගින් අරමුදල් ඵලදායී ලෙස භාවිතා කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | | කටයුතු සම්පූර්ණ කිරීම තහවුරු කර ගැනීම සඳහා භාණ්ඩාගාරය සහ අදාළ අධිකාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලන

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2017 ජූලි 27 වන දින විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකාවේ ගුවන් පාලම් (flyovers) ඉදිකිරීම සඳහා සහනදායී ණය පහසුකමක් ලබා දීමට හංගේරියානු රජය සිය එකඟතාව පළ කරන ලදී. ඒ අනුව, කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ හංගේරියානු අපනයන-ආනයන බැංකුව (EXIM) අතර 2021 අප්‍රේල් 08 වන දින මූල්‍යකරණ ගිවිසුමක් අත්සන් කරන ලදී. ඉන් අනතුරුව, කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සහ 'Betonutepito' පෞද්ගලික සමාගම අතර 2019 ජූනි 20 වන දින ගිවිසුමක් අත්සන් කරන ලදී. ඒ අනුව, 2021 අගෝස්තු 16 වන දින ඉදිකිරීම් කටයුතු ආරම්භ වූ අතර, කොහුවල පාලම 2024 පෙබරවාරි 15 වන දින සහ ගැටඹේ පාලම 2023 ජූනි 10 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, 2022 අප්‍රේල් 12 වන දින ශ්‍රී ලංකා රජය විසින් විදේශ ණය ආපසු ගෙවීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන්, හංගේරියානු | එකඟ වේ. | අරමුදල් සැපයීමේ බාධා ඇතිවන අවස්ථාවලදී කාලෝචිත තීරණ ගැනීම සහතික කිරීම සඳහා, ව්‍යාපෘති අධීක්ෂණ සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණ ක්‍රියාත්මක බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් තහවුරු කළ යුතුය. තවදුරටත් පිරිවැය ඉහළ යාම සහ මහජනතාවට සිදුවන අපහසුතා අවම කිරීම සඳහා, අත්හිටුවා ඇති ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම සහ නිම කිරීම කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අපනයන-ආනයන බැංකුව 2022 අප්‍රේල් 14 වන දින සිට සියලුම මුදල් නිකුත් කිරීම් අත්හිටුවන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 මැයි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස හයක කාලයක් සඳහා අදාළ කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය එකඟතාව මත අත්හිටුවීම සඳහා සේවා යෝජකයා (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ කොන්ත්‍රාත්කරු ('Betonutepito' සමාගම) අතර 2023 ඔක්තෝබර් 25 වන දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම අත්හිටුවීම පසුව තවදුරටත් එකඟතාවක් මගින් 2025 ජූනි 30 දක්වා දීර්ඝ කරන ලදී. 2025 පෙබරවාරි 14 වන දින, අදාළ ණය පහසුකම යටතේ මුදල් නිකුත් කිරීම් නැවත ආරම්භ කිරීමට නොහැකි බව හංගේරියානු අපනයන-ආනයන බැංකුව මුදල් අමාත්‍යාංශයට දැනුම් දෙන ලදී. 2026 ජනවාරි 20 දිනැති අංක 26/0052/809/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ කොන්ත්‍රාත්තුව නැවත ආරම්භ කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සහ අදාළ කොන්ත්‍රාත්කරු අතර 2026 පෙබරවාරි 10 වන දින අතිරේක ගිවිසුමක් අත්සන් කරන ලදී. සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකම යුරෝ 55,986,900ක් වූ අතර, කොන්ත්‍රාත්කරුගේ හිමිකම් පියවීම සඳහා යුරෝ 3,986,900ක අතිරේක පිරිවැයක් ද දැරීමට සිදුවිය. ඒ අනුව, මුල් ගිවිසුමට සාපේක්ෂව සමස්ත කොන්ත්‍රාත් වටිනාකම සියයට 7.67 කින් වැඩිවී තිබුණි. | | |
| (ආ) | 2019 ජූනි 20 දිනැති කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් (flyovers) සැලසුම් කිරීම සහ ඉදිකිරීම පිළිබඳ සංශෝධිත ගිවිසුමේ 1.1.3.3 වන විශේෂ කොන්දේසියට අනුව, ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන දිනයේ සිට මාස 03ක් ඇතුළත කොහුවල ගුවන් පාලමේ ඉතිරි කටයුතු ද, මාස 22ක් ඇතුළත ගැටඹේ ගුවන් පාලමේ කටයුතු ද සම්පූර්ණ කළ යුතුව ඇත. 2026 පෙබරවාරි 10 දිනැති අතිරේක ගිවිසුමේ 10 වන කොන්දේසියට අනුව, පහත කොන්දේසි සපුරාලීමෙන් අනතුරුව නැවත ආරම්භ කරන දිනය තීරණය කළ යුතුව ඇත. | සංශෝධිත කොන්ත්‍රාත් ගිවිසුමේ දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කළ යුතු ගෙවීම්වලින් සියයට 75ක් දැනටමත් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා අවසන් කර ඇත. කෙසේ වෙතත්, ඉතිරි සියයට 25ක මුදල ඇමරිකානු ඩොලර්වලින් විදුලි පණිවිඩ මගින් මුදල් හුවමාරු කිරීමේ (TT) කටයුතු සිදු කිරීමේදී, අදාළ ගෙවීම කොන්ත්‍රාත්කරුගේ ලාභයක් ලෙස සලකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා දූර්වල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳව විමර්ශනයක් සිදු කළ යුතු අතර, මෙම ගැටලු අවම කිරීම සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | i. අතිරේක ගිවිසුම බලාත්මක වී දින 28කට පසු<br>ii. අතිරේක ගිවිසුමේ 06 වන කොන්දේසිය යටතේ වන ගෙවීම් පියවීම<br>iii. කොන්ත්‍රාත්කරු විසින් ප්‍රතිග්‍රහණ ලිපිය (Letter of Acceptance) නිකුත් කර දින 28කට පසු<br>iv. කොන්ත්‍රාත්කරු වෙත අත්තිකාරම් ගෙවීම් සිදු කිරීම<br><br>කෙසේ වෙතත්, 2026 මාර්තු 27 වන විට ඉහත (ii) සහ (iv) කොන්දේසි සපුරා නොතිබීම හේතුවෙන් නැවත ආරම්භ කරන දිනය තීරණය කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, අතිරේක ගිවිසුමේ ඉහත (ii) ඡේදයේ සඳහන් කොන්දේසිය සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමිව නොතිබුණද, 2026 ජනවාරි 19 දිනැති අංක 26/0052/809/009 දරන කැබිනට් තීරණයට අනුව කැබිනට් සංදේශයේ 3.1, 3.2 සහ 3.3 යන කරුණු සඳහා අනුමැතිය ලබා දී තිබුණි. | සියයට 14ක ප්‍රේෂණ බද්දක් (remittance tax) පනවන ලදී. කොන්ත්‍රාත්කරු විසින් මෙම තීරණයට විරෝධය පළ කර ඇති අතර, එම ගැටලුව විසඳා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අතර සාකච්ඡා දැනට පැවැත්වෙමින් පවතී.<br><br>කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු විසින් දැනටමත් 2026 පෙබරවාරි 06 වන දින දැනටමත් අදාළ කාර්යයන් ආරම්භ කර තිබුණි.<br><br>තවද, අමාත්‍ය මණ්ඩල තීරණයේ 3.4 අනුව, ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමේදී අතිරේක ගිවිසුමක් අත්සන් කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, එහි දක්වා ඇති අවශ්‍යතා හතරෙන් එකක් ලෙස (ii) වන කොන්දේසිය ඇතුළත් කරමින් එම අතිරේක ගිවිසුම සකස් කර තිබුණි. | |
| (ඇ) | ගැටඹේ ගුවන් පාලම ඉදිකිරීම හේතුවෙන් ගැටඹේ හන්දියේ පිහිටි රණවිරු ස්මාරකය ඉවත් කිරීමට සිදුවිය. පැරණි ස්මාරකය වෙනුවට නව රණවිරු ස්මාරකයක් ඉදිකිරීමට මෙම ව්‍යාපෘතිය යෝජනා කර තිබූ අතර, ඒ සඳහා ව්‍යාපෘතියේ නගර සැලසුම්කරු විසින් සංකල්පීය සැලැස්මක් ඉදිරිපත් කර තිබුණි. ඊට අදාළ අනුමැතිය 2022 අගෝස්තු 18 වන දින II වන සේනාංක මූලස්ථානයේ අණදෙන නිලධාරිවරයා විසින් ලබා දී තිබුණි. අතිරේක ගිවිසුමට අනුව 2026 පෙබරවාරි 10 දින ගැටඹේ ගුවන් පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණද, විගණිත දිනය වූ 2026 මාර්තු 27 වන විටත් කොන්ත්‍රාත්කරු විසින් රණවිරු ස්මාරකයට අදාළ වැඩ සැලැස්ම සහ පිරිවැය ඇස්තමේන්තුව සේවාලාභියා වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, රණවිරු ස්මාරකය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 12.44 ක ඇස්තමේන්තුවක් II වන සේනාංක මූලස්ථානයේ ව්‍යාපෘති නිලධාරිවරයා විසින් 2022 අප්‍රේල් 26 වන දින ඉදිරිපත් කර තිබුණි. | 'රණවිරු' ස්මාරකය සම්බන්ධ කාරණය කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කරන ලද අතර, යෝජිත කාර්යය සඳහා වන ඇස්තමේන්තුව නියමිත කාලය තුළ ඉදිරිපත් කිරීමට එකඟ විය. මෙම ක්‍රියාකාරකම, අදාළ කොන්ත්‍රාත්තුව යටතේ සිදු කෙරෙන නාගරික භූ අලංකරණ කටයුතු (urban landscaping) යටතේ ක්‍රියාත්මක කෙරෙනු ඇත. | සමාජීය වශයෙන් වැදගත් වන මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිය ප්‍රමාද වීම හේතුවෙන් ඇතිවන සමාජීය බලපෑම අවම කිරීම සඳහා ප්‍රධාන ගණන්දිමේ නිලධාරියා සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගැටඹේ ගුවන් පාලම (flyover) ඉදිකිරීම සඳහා, රණවිරු ළමා උද්‍යානය පිහිටි ඉඩම් කොටසෙන් පර්චස් 89ක භූමි ප්‍රදේශයක් මෙන්ම රථ ගාලක් සමඟ ගොඩනැගිලි 04ක් ඉවත් කිරීමට අවශ්‍යව තිබුණි. මේ සඳහා, ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාළව ආරක්ෂක අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 14.16ක මුදලක් මහාමාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශය විසින් මුදාහැර තිබුණි. එම මුදල අදාළ කාර්යය සඳහා වැය නොකළ බැවින්, එය නැවත ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් 2025 පෙබරවාරි 21 දිනැති අංක RDA/MFAP/HUN/FO/GAT/LAO දරන ලිපිය මගින් දැනුම් දී ඇති පරිදි, ගුවන් පාලම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා රණවිරු ළමා උද්‍යානයට අයත් මෙම ඉඩම ඉතා වැදගත් බවත්, පාලම ඉදිකිරීම සඳහා මෙම ඉඩම ලබාදීම ප්‍රමාද වුවහොත් කොන්ත්‍රාත්කරුට මසකට අවම වශයෙන් රු. මිලියන 16.5ක අතිරේක මුදලක් ගෙවීමට සිදුවිය හැකි බවත් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සඳහන් කර තිබුණි. කෙසේ වෙතත්, අදාළ අරමුදල් ආරක්ෂක අමාත්‍යාංශය වෙත මාරු කර නොතිබූ අතර, 2026 මාර්තු 27 වන විටත් යුද හමුදා මූලස්ථානය විසින් එම ගොඩනැගිල්ල ඉදිකර නොතිබුණි. තවද, ළමා උද්‍යානය මැද පිහිටි ඇළ මාර්ගයේ දෙපස තිබූ ගොඩනැගිල්ල ද යුද හමුදාව විසින් ඉවත් කර නොතිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත් අවශ්‍යතාවලට අනුකූලව ව්‍යාපෘති භූමිය නියමිත වේලාවට සහ සම්පූර්ණ වශයෙන් කොන්ත්‍රාත්කරු වෙත භාර දී නොමැති බව නිරීක්ෂණය විය. | රුපියල් මිලියන 14.16ක මුදලක් වෙන් කිරීම සම්බන්ධයෙන් විධිමත් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2 වන සේනාංකයේ අනදෙන නිලධාරියාට දැනුම් දෙන ලදී. ඒ අනුව, අදාළ ඉල්ලීම ලැබී ඇත. 2026 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන යටතේ මුදල් වෙන් කිරීමට පියවර ගනු ඇත. | අදාළ ස්ථානයේ භාරකාරිත්වය නියමිත වේලාවට කොන්ත්‍රාත්කරු වෙත පවරා දීම සහතික කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා සහ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඉ) | 2023 ඔක්තෝබර් 25 දින සේවායෝජකයා සහ කොන්ත්‍රාත්කරු විසින් අත්සන් කරන ලද කොහුවල ගුවන් පාලම නිර්මාණය කිරීම හා ඉදිකිරීම සඳහා වූ ගිවිසුම අන්‍යෝන්‍ය එකඟතාවයෙන් තාවකාලිකව අත්හිටුවීම සම්බන්ධ අවබෝධතා ගිවිසුම (MOU) ක්‍රියාත්මක කිරීම සඳහා එම පාර්ශ්ව දෙක විසින් අත්සන් කරන ලද අතිරේක ගිවිසුම් අනුව, ව්‍යාපෘති භූමියේ ආරක්ෂාව හා සුරක්ෂිතතා ක්‍රියාමාර්ග පවත්වාගෙන යමින් කොහුවල ගුවන් පාලමේ තට්ටුවේ කොන්ක්‍රීට් දැමීමේ (deck concreting) කටයුතු | කාණු පද්ධතිය ඉදිකිරීමේ කටයුතු සඳහා අවශ්‍ය මූලික සලකුණු කිරීමේ කටයුතු කොන්ත්‍රාත්කරු විසින් ආරම්භ කර ඇති අතර, වැඩ ආරම්භ කරන දිනය තහවුරු වූ පසු ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා, විශේෂයෙන් මහජන ආරක්ෂාවට අදාළ කටයුතු අසම්පූර්ණව පවතින විට, ඕනෑම පොදු යටිතල පහසුකම් විවෘත කිරීමට පෙර, අවදානම් තක්සේරු කිරීම සහ ක්‍රියා පටිපාටි සඳහා සම්මත ක්‍රමවේද සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්පූර්ණ කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ වී තිබුණි.<br><br>කෙසේවෙතත්, ඉතිරි වැඩ කටයුතු සම්පූර්ණ කිරීමට පෙර, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් 2024 ජූලි 17 දින කොහුවල ගුවන් පාලම මහජනතාවගේ භාවිතය සඳහා විවෘත කිරීමට කටයුතු කර තිබුණි. | | |
| (ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.9.3 ඡේදයට අනුව, රුපියල් මිලියන 500 ඉක්මවන ඕනෑම භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා වන කොන්ත්‍රාත් ගිවිසුම රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අත්සන් කළ යුතුය. කෙසේ වෙතත්, රුපියල් මිලියන 10,192 ක කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත් ගිවිසුම 2019 ජුනි 20 වන දින මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් නිසි අධිකාරියකින් තොරව අත්සන් කර තිබුණි. තවද, රුපියල් මිලියන 17,968 ක් වටිනා කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා වන අතිරේක ගිවිසුම ද 2026 පෙබරවාරි 10 වන දින මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති විසින් අත්සන් කර තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරි පනත මගින් පවරා ඇති බලතල අනුව, මහාමාර්ග අමාත්‍යාංශය වෙනුවෙන් මාර්ග ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් අත්සන් තබා ඇති බව නිරීක්ෂණය වී ඇත. කෙසේ වෙතත්, 2025 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.25 වගන්තියට අනුව, බලතල පැවරීම සඳහා විධිවිධාන පවතී. | සභාපතිවරයා තම බලතල ඉක්මවා ගියේ කුමන තත්වයන් යටතේ දැයි තීරණය කිරීම සඳහා විධිමත් විමර්ශනයක් පැවැත්විය යුතුය. |
| (උ) | ගැටඹේ ගුවන් පාලම සඳහා අත්පත් කරගත් මුළු ඉඩම් කොටස් 152න් කොටස් 07ක් වෙනුවෙන් රුපියල් මිලියන 29.13ක වන්දි සහ පොලී ගෙවීම් ද, කොහුවල ගුවන් පාලම සඳහා අත්පත් කරගත් මුළු ඉඩම් කොටස් 167න් කොටස් 108ක් වෙනුවෙන් රුපියල් මිලියන 1,140.27ක මුදලක් ද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් ගෙවා අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය ගැටඹේ ව්‍යාපෘතිය සඳහා සියයට 5ක් සහ කොහුවල ව්‍යාපෘතිය සඳහා සියයට 65ක් ලෙස පැවතුණි. එබැවින්, එම ගුවන් පාලම් දෙකෙහිම ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ (LAQ) ප්‍රමාදයට ප්‍රධාන හේතුව වූයේ ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් පැවති අවිනිශ්චිතතාවයි. කෙසේ වෙතත්, මිනින්දෝරු, තක්සේරු සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තු මෙන්ම අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන්, මහනුවර ප්‍රාදේශීය ලේකම්වරයා සමඟ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධ සම්බන්ධීකරණ රැස්වීම් කිහිපයක් පවත්වා ඇත. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ සියලුම පියවරයන් සඳහා අවශ්‍ය ලේඛන සහිත අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීමටත්, එම ක්‍රියාවලියේ නිරත නිලධාරීන්ට ඒ පිළිබඳව උපදෙස් ලබා දීමටත් පියවර ගත යුතුය. |
| (ඌ) | කොහුවල ගුවන් පාලම සඳහා අත්පත් කරගත් ඉඩම් කොටස් 107ක් වෙනුවෙන් වන්දි ගෙවීම් කටයුතු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් සම්පූර්ණ කර තිබුණද, සමාලෝචිත | අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල, අදාළ නීතිමය විධිවිධානවලට අනුකූලව 44 වැනි වගන්තියට අදාළ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ස්වාධීනව කටයුතු කරන | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ සියලුම පියවරයන් සඳහා අවශ්‍ය ලේඛන සහිත අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි ස්ථාපිත |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය අවසන් වන විටත් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තියට අදාළ සහතිකය එම ඒකකය විසින් ලබාගෙන නොතිබුණි. | අතර, එවැනි ක්‍රියා පටිපාටිවලට මැදිහත් වීම සම්බන්ධයෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට (PMU) ඇත්තේ සීමිත බලයකි. | කිරීමටත්, එම ක්‍රියාවලියට සම්බන්ධ නිලධාරීන්ට උපදෙස් ලබා දීමටත් පියවර ගත යුතුය. |
| (එ) | මුදල් රෙගුලාසි 135 හි විධිවිධාන ප්‍රකාරව, ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් වූ වන්දි, ව්‍යවස්ථාපිත ගෙවීම් සහ පොලී ගෙවීම් සඳහා වන 'අනුමත කිරීමේ නිලධාරියා' ලෙස ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කමිටුව (LARC) සහ විශේෂ ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කමිටුව (SLARC) නම් කරනු ලැබීය. 2014 මැයි 30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1864/54 දරන ගැසට් පත්‍රයේ 3 (1) වන නියෝගය ප්‍රකාරව, යම් ව්‍යාපෘතියක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී අදාළ ඉඩමේ වෙළඳපල වටිනාකම සහ අත්පත්කර ගැනීම හේතුවෙන් ඇතිවන අහිතකර බලපෑම් සඳහා ගෙවිය යුතු වන්දි මුදල තක්සේරු කිරීම, එම ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා පත් කර ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කමිටුව විසින් සිදු කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් (flyovers) සඳහා අත්පත් කරගත් ඉඩම් සම්බන්ධයෙන්, මුදල් රෙගුලාසි 136 සහ අංක 1864/54 දරන ගැසට් පත්‍රයේ විධිවිධානවලට අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කමිටුවේ (LARC) තක්සේරුව ලබා නොගෙන, ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරියා විසින් ලබා දුන් නිර්දේශ මත පදනම්ව 2025 වසරේදී රුපියල් මිලියන 39.48ක වන්දි මුදලක් සහ රුපියල් මිලියන 57.64ක පොලී මුදලක් ගෙවා තිබුණි. | 2014 මැයි 30 දිනැති අංක 1864/54 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව, ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ව්‍යාපෘති 18ක ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කමිටුව (LARC) යටතේ සහ හොරණ-පාමංකඩ මාර්ග ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ. යෝජිත කොහුවල ගුවන් පාලම අදාළ මාර්ග කොරිඩෝව තුළ පිහිටා ඇති බැවින්, එම ගුවන් පාලම ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් අත්පත් කර ගැනීමක් අවශ්‍ය විය. ඒ අනුව, ක්‍රියාවලියේ අනුකූලතාව පවත්වා ගැනීමට සහ ක්‍රියා පටිපාටිමය විෂමතා මගහරවා ගැනීමට, එම ගුවන් පාලමට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ද LARC යටතේම සිදු කරන ලදී.<br><br>කෙසේ වෙතත්, 2009 මාර්තු 17 දිනෙන් පසුව ආරම්භ කරන ලද ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු, 2009 අප්‍රේල් 07 දිනැති අංක 1596/12 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුකූලව සිදු කළ යුතුව ඇත. ඒ අනුව, ගැටඹේ ගුවන් පාලමට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු එම ගැසට් නිවේදනයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාත්මක කෙරෙමින් පවතින අතර, ඒ අනුව වන්දි ගෙවීම් ද සිදු කළ යුතුව ඇත. | එවැනි ගෙවීම් සිදු කිරීමට පෙර, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් මුදල් රෙගුලාසි සහ අදාළ ගැසට් විධිවිධානවලට අනුකූල වීම තහවුරු කළ යුතුය. |